සැ. යු. - 2010.09.24 වැනි දින පළවූ අංක 1,673 දරන ගැසට් පත්‍රයේ I-II (අ) සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,674 - 2010 ඔක්තෝබර් මස 01 වැනි සිකුරාදා - 2010.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | 1706 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1708 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1709 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 136

**පත් කිරීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත නම් සඳහන් නිලධාරියා ඉදිරියෙන් ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා අධිකරණ සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරී තනතුරට පත් කරනු ලැබේ :-

| *නිලධාරියාගේ නම* | *පත් කරනු ලැබූ දිනය* |
|---|---|
| ආර්. එම්. ජයවර්ධන මහතා, අංක 3171/ඒ/2, පුබුදු පුර පාර, තුන්වැනි පියවර, අනුරාධපුරය. | 2010.07.22 |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

මංජුල තිලකරත්න,
නියෝජ්‍ය ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට.

2010 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

10-40

---

2010 අංක 137

**ස්ථාන මාරු පත්වීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත සඳහන් අධිකරණ නිලධාරීන් ස්ථාන මාරුවීම් පත්වීම් කරනු ලැබේ :-

| *අනු. අංකය* | *නිලධාරියාගේ නම* | *ස්ථාන මාරු පත්වීම ක්‍රියාත්මක වන දිනය* | *අධිකරණය/පත්වීම්* |
|---|---|---|---|
| 01 | එම්. සී. බී. මොරායස් මහතා | 2010.07.26 | ගල්කිස්ස දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහෙස්ත්‍රාත් හා අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 02 | එම්. එම්. එම්. මිහාල් මහතා | 2010.07.23 | අධිකරණ සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අධිකරණ) |
| 03 | එච්. කේ. එන්. පී. අල්විස් මහතා | 2010.08.01 | කොළඹ අතිරේක මහෙස්ත්‍රාත්, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 04 | ආර්. ටී. ටී. ගමගේ මෙනෙවිය | 2010.08.01 | තඹුත්තේගම මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 05 | ටී. ජේ. ප්‍රභාකරන් මහතා | 2010.08.01 | අක්කරපත්තුව දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහෙස්ත්‍රාත්, අතිරේක ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 06 | ටී. සරවනරාජා මහතා | 2010.08.01 | අක්කරපත්තුව මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 07 | ඒ. එම්. එම්. රියාල් මහතා | 2010.08.01 | වාලච්චේන දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 08 | එස්. එච්. එම්. එන්. ලක්මාලි මෙනවිය | 2010.08.16 | මාරවිල දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 09 | ඒ. ටී. එන්. ප්‍රනාන්දු මහත්මිය | 2010.08.16 | ගල්කිස්ස මහෙස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 10 | එස්. එම්. එච්. එස්. පී. සේතුංග මහතා | 2010.08.16 | ගම්පහ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහෙස්ත්‍රාත්, අතිරේක ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |

| අනු. අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු පත්වීම් ක්‍රියාත්මක වන දිනය | අධිකරණය/පත්වීම් |
|---|---|---|---|
| 11 | ඩබ්ලිව්. ආර්. ආර්. එන්. වතුපොල මහතා | 2010.08.16 | කොළඹ දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 12 | පී. රණසිංහ මහතා | 2010.08.16 | ගම්පහ දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහෙස්ත්‍රාත්, අතිරේක ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

මංජුල තිලකරත්න,
නියෝජ්‍ය ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට.

2010 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

10-38

---

2010 අංක 138

**වැඩ බැලීමේ පත්වීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත සඳහන් වැඩ බැලීමේ පත් කිරීම් සිදුකර ඇත :-

| අනු. අංකය | නිලධාරියාගේ නම | කාල සීමාව | ස්ථානය සහ වැඩ බැලීමේ පත්වීම |
|---|---|---|---|
| 01 | එච්. එස්. යූ. රම්‍ය කුමාර මහතා | 2010.07.26 සිට 2010.08.01 දක්වා | කෑගල්ල වැඩ බලන මහෙස්ත්‍රාත් වශයෙන් |
| 02 | එම්. එච්. ෆරික්ඩීන් මහතා | 2010.09.01 සිට 2010.10.01 දක්වා | අත්තනගල්ල වැඩ බලන දිසා විනිශ්චයකාර |
| 03 | කේ. කජනිතිබාලන් මහතා | 2010.09.10 සිට 2010.09.22 දක්වා | වැඩබලන කයිට්ස් මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත් ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 04 | ආර්. ඒ. එම්. රාජපක්ෂ මහතා | 2010.07.29 සිට 2010.08.14 දක්වා | මීනුවන්ගොඩ වැඩ බලන දිසා විනිශ්චයකාර සහ මහෙස්ත්‍රාත් |
| 05 | ආර්. එම්. ඒ. පෙරේරා මහතා | 2010.07.29 සිට නැවත නියමයක් කරන තෙක් | කොළඹ වැඩ බලන අතිරේක දිසා විනිශ්චයකාර |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

මංජුල තිලකරත්න,
නියෝජ්‍ය ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට.

2010 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

10-39

2010 අංක 139

**පත් කිරීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත සඳහන් නිලධාරීන් ඉදිරියෙන් සඳහන් කර ඇති අධිකරණ වල විනිශ්චයකාරවරුන් ලෙස පත් කරනු ලැබේ :-

| අනු. අංකය | නිලධාරියාගේ නම | පන්තිය හා ශ්‍රේණිය | පත්වීම් ක්‍රියාත්මක වන දිනය | අධිකරණය/පත්වීම් |
|---|---|---|---|---|
| 01 | ආර්. එම්. ජයවර්ධන මහතා | I පන්තිය I ශ්‍රේණිය | 2010.08.01 | මුලතිව් දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 02 | කේ. ඒ. චන්දන මහතා | II පන්තිය I ශ්‍රේණිය | 2010.08.16 | මාරවිල අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහෙස්ත්‍රාත්, අතිරේක ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

මංජුල තිලකරත්න,
නියෝජ්‍ය ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට.

2010 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

10-41

# රජයේ නිවේදන

**ඓතිහාසික දේවාලවල ඇසළ පෙරහැර මංගල්‍යයක් වන්දනා ආඥාපනත යටතේ ගැසට් කිරීම**

1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් හේරත් මුදියන්සේලාගේ හේමන්ත බංඩාර වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2010 අම්මඩුව කුඩාකතරගම ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පනවමි :

01. 2010 ඔක්තෝබර් මස 08 වැනි දින අම්මඩුව කුඩාකතරගම දේවාලයේ උත්සවය ආරම්භ වී 2010 ඔක්තෝබර් මස 28 වැනි දින දිය කැපීමෙන් පසු අවසන් වන බව දැනුම් දෙමි ;

02. දේවාලයේ සිට සිව්දිසාවට යාර හාරසියයකින් යුක්ත වපසරියකින් යුක්ත වේ. ගොඩකවෙල අම්මඩුව මාර්ගයේ කිලෝ මීටර් 7 4/3 තැන පිහිටි කිවුලේ කුඹුර සිට පත්තිනි කපු නිලයට අයත් ඉඩමේ කෙලවරේ බෝක්කුව දක්වා භූමි භාගය මැදිව පිහිටි ප්‍රදේශය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා වූ කඳවුරු භූමියක් වශයෙන් නම් කෙරේ ;

03. දේවාල භූමිය උඩමලුව, පිටවීදිය, දෙවන මලුව හා ඒ අවට භූමිභාගවල ආහාර පිසීම තහනම් කරමි ;

04. දේවාල භූමියට මුහුණලා ඇති පහල මලුවේ සිංහාසන මන්දිරය දෙපස වන්නට මාවිසින් හෝ බස්නායක නිලමේ විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර මත වියලි ආහාර, පූජා භාණ්ඩ, විසිතුරු මෙවලම් විකිණීම සඳහා අවසර දෙමි. සිංහාසන මන්දිරයට පිටුපසින් දිවෙන මාර්ගයේ දකුණු පසට වන්නට අහාර පාන විකිණීම සඳහා මාගේ අනු දැනුම මත බස්නායක නිලමේගේ අනු දැනුමට යටත්ව අවසර දෙමි. අප විසින් නියම කරන උපදෙස් හා සීමාවන්ට යටත්ව මෙම අවසරය ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කරමි ;

05. ඉහත 4 වගන්තිවලින් නියම කර ඇති පූජා භූමිය තුළ හැර අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි ;

06. පෙරහැර ගමන් ගන්නා මාර්ගයේ පුද්ගලික වාහන ඇතුල් කිරීම හෝ නවතා තැබීම හෝ තහනම් කරමි. මාගේ හෝ බස්නායක නිලමේගේ හෝ අවසරයක් නොමැතිව වාහන ඇතුල් කිරීම හෝ නතර කිරීම හෝ නොකළ යුතු ය ;

07. දේවාලයේ ඉහල මලුවට වාහන ඇතුල් කිරීම, නවතා තැබීම තහනම් කරමි. මාගේ හෝ බස්නායක නිලමේගේ හෝ අවසරයක් මත මිස වාහන ඇතුලු කිරීම නොකළ යුතුය ;

08. මා විසින් අදාළ භූමියේ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බඳුදෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ ;

09. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදුගන්නා වෙළෙන්දන් විසින් ඇසල උත්සවයෙන් පසු තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් හා අධීක්ෂණය පරිදි ඉවත් කළ යුතුය ;

10. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි ;

11. කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්ගෙන් අවසර ලබාගෙන මිස විදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙනත් කර තබන්නාවූ හෝ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගංඉවුරු මෙන් සැදී තිබෙන්නා වූ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය ;

12. මාගේ අනුදැනම ඇතුව බස්නායක නිලමේගේ අවසරය ඇතුව මිස රතිඤ්ඤා, වෙඩි ආදිය පත්තු කිරීම තහනම් වේ ;

13. මාගේ හෝ බස්නායක නිලමේගේ අවසරයකින් තොරව ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය (අදාළ ප්‍රදේශය තුළ) ;

14. මාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව වන්දනාකරුවන් සඳහා කෑමබීම බෙදාදීම සඳහා අදාළ භූමියේ කිසිම ස්ථානයක් පාවිච්චි කිරීම තහනම් වේ.

එච්. එම්. එච්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගෙපොල.

10-103

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 392458 සහ 464552.
ගිණුම් අංකය : 1103003595,
මැල් පතිරණ.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ජූනි මස 18 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1047 හා 2005 මැයි මස 09 වැනි දින දරන බැඳුම්කරය සහ අංක 1725 සහ 2006 ඔක්තෝබර් මස 09 වැනි දින දරන බැඳුම්කරය සහ අංක 2705 සහ 2008 අගෝස්තු මස 14 වැනි දින දරන බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් එහි බන්ධනදායී වන ඉහත කී මැල් පතිරණ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, ඉහත කී බැඳුම්කර මත 2010 මැයි මස 17 වැනි දිනට රුපියල් හතලිස්තුන්ලක්ෂ පනස්පන්දහස් හාරසිය දහඅටකුත් ශත හතලිස්එකක (රු. 43,55,418.41) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත වර්තමානයේ දී ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී රුපියල් හතලිස්තුන්ලක්ෂ පනස්පන්දහස් හාරසිය දහඅටකුත් ශත හතලිස්එකක (රු. 43,55,418.41) මුදල සහ 2010 මැයි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හයලක්ෂ තිස්හතරදහස් අටසියයක (රු. 6,34,800) මුදල මත වර්ෂයකට 20% බැගින් පොළිය ද, රුපියල් අටලක්ෂ දහහත්දහස් හාරසියයක (රු. 8,17,400) මුදල මත 19% බැගින් පොළිය ද, රුපියල් විසිහයලක්ෂ පනස්හත්දහස් නවසිය දහසයකුත් ශත හැත්තෑපහක (රු. 26,57,916.75) මුදල මත 22% බැගින් පොළිය ද, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් වෙනත් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1047, 1725 සහ 2705 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, අළුත්කඩේ වීදියේ අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙලබඩ පත්තුවේ, කරන්දෙනියේ කුරුදුගහ නමැති ගමේ පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද කොටස අනුබෙදීමක් වන බෙදා වෙන් කළ ලොට් 05 නමැති බිම් කොටසට මායිම්, උතුරට සහ නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 4 (පාර) ද, දකුණට : අස්සලුකන්දඅද්දර ඕවිට ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 06 ද යන මායිම් තුළ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක 2197 සහ 1996 දෙසැම්බර් මස 3 වැනි දින දරන පිඹුරේ නිරූපිත පරිදි පර්චස් දොළහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.50) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි පස, ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A184/246 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද ඉහත කී අංක 2197 දරන පිඹුරේ නිරූපිත ලොට් 04 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් පරවශතා අයිතිවාසිකම් ද සමග ය.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

10-118

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කටුනේරිය ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0550-02121496-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 12 දිනැති අංක 728 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මාදම්පේ පදිංචි ජයවර්ධන ගෝමාරගේ දොන් ඇන්ටන් රන්සිරි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ විසිතුන්දහස් තුන්සිය විසිහතයි ශත හතලිස්හතක (රු. 20,23,327.47) මුදලක්, 2009 සැප්තැම්බර් මස 10 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 20,23,327.47 මුදල ද, 2009 සැප්තැම්බර් මස 11 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 728 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ගන්දහය කෝරළේ පාත හේවාහැට කැටවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න විසින් සාදන ලද 1967.11.10 දිනැති අංක 839 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රදාගස්පානේ හේන නමැති ඉඩමේ ලොට් 04 ලෙස නිරූපනය කරනු ලබන බෙදූ ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී සැලැස්මේ සඳහන් ලොට් 05 ද, නැගෙනහිරට : නැහිනිවෙලට යන පාර ද, දකුණට : අන්දිරිස් අප්පුහාමිගේ ඉඩම සහ බස්නාහිරට : අංක 426 දරන සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසිහයයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 26.5) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජී 246/55හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම ඉහත සඳහන් ඉඩමේ නැවත මැනීමකි :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ගන්දහය කෝරළේ පාත හේවාහැට කැටවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. බී. විජේකෝන් විසින් සාදන ලද 2006.09.08 දිනැති අංක 3190 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රදාගස්පානේ හේන, නමැති ඉඩමේ ලොට් 01 ලෙස නිරූපණය කරනු ලබන බෙදූ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 426 දරන සැලැස්මේ සඳහන් ලොට් 01 සහ අංක 11 දරන සැලැස්මේ සඳහන් ලොට් 01 සහ 02 ද, නැගෙනහිරට : අංක 11 දරන සැලැස්මේ සඳහන් ලොට් 11 සහ පුලියද්ද සිට අම්පිටියට යන පාර ද, දකුණට : පුලියද්ද සිට අම්පිටියට යන පාර සහ අන්දිරිස් අප්පුහාමිගේ ඉඩම සහ බස්නාහිරට : අන්දිරිස් අප්පුහාමිගේ ඉඩම සහ අංක 426 දරන සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දහතුනක් (අ. 0, රූ. 3, පර්. 13) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජී 432/98 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-176/1

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 373763
ණය ගිණුම් අංකය : 1490001814.
සින්නප්පන් අමීර්දම් රවුතිලෙස්,
වැලිවිට විතානගේ දෝන ජැනට් බ(ර්)ට්රූට් රාජේශ්වර්යා.

2010 මාර්තු මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :-

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. බී. සී. ගුණතිලක විසින් 2007 මැයි මස 10 වැනි දින සහතික කරන ලද අංක 3741 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සින්නප්පන් අමීර්දම් රවුතිලෙස් සහ වැලිවිට විතානගේ දෝන ජැනට් බ(ර්)ට්රූට් රාජේශ්වර්යා ණයකරුවන් හැටියට ද, වැලිවිට විතානගේ දෝන ජැනට් බ(ර්)ට්රූට් රාජේශ්වර්යා උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන හතරක් සහ තිස්දෙදහස් දෙසීයයි ශත පහළොවක (රු. 40,32,200.15) මුදලක් 2009 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හතරක් සහ තිස්දෙදහස් දෙසීයයි ශත පහළොවක (රු. 40,32,200.15) මුදලක් අයකර ගැනීම සඳහා 2009 ඔක්තෝබර් මස 1 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 37,86,226.15 ක මුදල මත 22% ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 3741 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍ර, කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චිය කරනු ලබයි.

### උපලේඛනය

අනුඥාලත් මිනින්දෝරු එච්. පී. එස්. රාජපක්ෂ විසින් 2002 සැප්තැම්බර් මස 3 වැනි දින සාදන ලද අංක 1121 දරන පිඹුරෙහි දැක්වෙන සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ, නීහිටිය පිහිටි හිරිලියද්ද කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන්කර ලොට් 1 ලෙස ලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම කොටසකින් ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටසකින් සහ පාරෙන් ද, දකුණට : පාර ද සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A613/237 වෙළුමෙහි/පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

10-117

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මොරටුව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.06.23 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0090-153838-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1999 මාර්තු මස 05 දිනැති අංක 1573 සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. එස්. සී. පී. ගුණරත්න විසින් සහතික කරන ලද 2008 ජනවාරි මස 22 වැනි දිනැති අංක 1071 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මොරටුව පදිංචි වීරහෙන්නදිගේ මනෝජ් හර්ෂනාත් ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හත්ලක්ෂ අනූහතරදහස් හත්සිය හැටඑකයි ශත අසූනවයක (රු. 7,94,761.89) මුදලක්, 2009 සැප්තැම්බර් මස 16 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 7,94,761.89 මුදල ද, 2009 සැප්තැම්බර් මස 17 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1573 සහ 1071 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන පානදුර තල්පිටි දෙබැද්ද මාලමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ජී. මල්වැන්න විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 14 දිනැති අංක 659 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගගහකනත්ත නමැති ගොඩනැගිලි ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 659 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : අංක 659 දරන සැලැස්මේ සඳහන් ලොට් 9 ද, දකුණට : අංක 659 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 සහ බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක් යන මායිම් තුළ එකී අංක 659 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එෆ් 304/28හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම උඩින් මාර්ග අයිතිය සමග.

පෙර කී මාලමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ජී. මල්වැන්න විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 14 වැනි දිනැති අංක 659 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගගහකනත්ත නමැති ලොට් 9 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 659 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටස ද, දකුණට : පානදුර සිට මාලමුල්ලට යන ප්‍රධාන පාර සහ බස්නාහිරට : අංක 659 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සිට 8 යන මායිම් තුළ පර්චස් විසිහතරක් (අ. 0, රූ. 0, පර්. 24) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එෆ් 304/280 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-176/2

---

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - බුත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මුතුව දූරයාලගේ නන්දෝරිස්.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන

ලද්දාවූ ද 2003.03.24 දින අංක 703 සහ බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2009.01.08 දින අංක 16211 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුව දුරයාලගේ නන්දෝරිස් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙලක්ෂ පනස්නවදහස් හත්සිය දාසයයි ශත අට (රු. 2,59,716.08) ක මුදලක් 2010.06.28 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,59,716.08ක මුදලට 2010.06.29 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 703 සහ 16211 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර කොට්ඨාසයෙහි, කඳුකර කෝරළේ, කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි, බඩල්කුඹුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුගහගල්ගේ ගමෙහි, ගංගේයායහි පිහිටි ඉඩම් කොටසට මායිම් වන උතුරට : එම්. බී. රංජිත් සුනිල් ශාන්ත හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : මැණික් ගඟ පාර රක්ෂිතයෙන් ද, දකුණට : මැණික් ගඟ පාර රක්ෂිතයෙන් ද, බස්නාහිරට : මැණික් ගඟ රක්ෂිතයෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි, රූඩ් එක (අ. 1, රූ. 1, පර්. 0) ක් විශාල ඉඩම තුළ පිහිටි සියළුම දේත් සමග. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් ඩී ඕ/එල් 24/170 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම නැවත මැන බලයලත් මානක ජී. ජී. පී. හස්තනායක විසින් 1999 ජනවාරි මස 02 වැනි දින සහ අංක 3280 දරන පිඹුරේ පහත පරිදි විස්තර වේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර කොට්ඨාසයෙහි කඳුකර කෝරළේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි බඩල්කුඹුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි ගංගේයාය කටුගහගල්ගේ ගමෙහි පිහිටි "ගංගේ මීගොඩයාය" නමැති ඉඩමට බලයලත් මානක ජී ජී. පී. හස්තනායක විසින් මැන සාදන ලද අංක 3280 සහ 1999.01.02 දින දරන පිඹුරේ ලොට් 01 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. බී. රංජිත් සුනිල් ශාන්ත හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : එම්. ඩී. නන්දෝරිස් හිමිකම් කියන එම ඉඩමේම කොටසකින් ද, දකුණට : පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, බස්නාහිරට : මැණික් ගඟ රක්ෂිතයෙන් ද මායිම් වූ අංක 3280 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් එක (අ. 1, රූ. 1, පර්. 0)ක් විශාල ඉඩම තුළ පිහිටි සියළුම දේත් සමග සහ ඉහත කී අංක 3280 සහ 1999.01.02 දිනැති ජී. ජී. පී. හස්තනායක බලයලත් මානක විසින් මැන සාදන ලද පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/4

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බුත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ධනපාල මුදියන්සේලාගේ විමලදාස සහ ධනපාල මුදියන්සේලාගේ ඉන්දික කපිල බණ්ඩාර.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.11.21 දින අංක 16146 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ධනපාල මුදියන්සේලාගේ විමලදාස සහ ධනපාල මුදියන්සේලාගේ ඉන්දික කපිල බණ්ඩාර යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස්හතරදහස් දෙසිය විසිහයයි ශත හතලිස්හත (රු. 2,44,226.47) ක මුදලක් 2009.12.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,44,226.47ක මුදලට 2010.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 16146 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බුත්තල කෝරළේ, කරවිලේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කරවිලේ ගමෙහි පිහිටි රජයේ ඉඩම් කොටසට මායිම් වන උතුරට : එම්. රාජපක්ෂ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : එම්. රාජපක්ෂ හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : තණමල්විල පාරෙන් ද, බස්නාහිරට : කේ. පී. පීටර් හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාර පර්චස් විසිහතර (අ. 0, රූ. 0, පර්. 24)ක් විශාල ඉඩම තුළ පිහිටි සියළුම දේත් සමග. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ/එම් 95/174 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම බලයලත් මානක කේ. ඩබ්. එස්. කේ. විග්නරාජා විසින් 2008 නොවැම්බර් මස 04 වැනි දින සහ අංක එම්. ඕ/1391 දරන පිඹුර නැවත මැනීමකට ලක් කිරීමෙන් අනතුරුව මෙසේ විස්තර වේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සෙල්ලකතරගම ගමෙහි "සෙල්ලකතරගම කැලේ " නමැති ඉඩම අංක එම්. ඕ/1391 දරන පිඹුර ප්‍රකාර ලොට් ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. පී. ජී. අරුණතිලක හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ඩී. පී.

ජී. අරුණතිලක හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : තණමල්විල-සෙල්ලකතරගම පාරෙන් ද සහ බස්නාහිරට : කේ. පී. පීටර් හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විසිහතර (අ. 0, රූ. 0, පර්. 24) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි බිංදුවයි අට (හෙක්. 0.0608) ක් විශාල ඉඩම තුළ පිහිටි සියළුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කළුතර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පිල්ලලියන ආරච්චිගේ සුනිල් රත්නසිරි.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2005.10.13 දින අංක 7742 සහ පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් 2007.02.13 දින අංක 1861 සහ 2008.02.28 දින අංක 2299 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පිල්ලලියන ආරච්චිගේ සුනිල් රත්නසිරි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිඑක්ලක්ෂ පනස්දහස් තුන්සිය තිස්අටයි ශත හැටතුන (රු. 21,50,338.63) ක මුදලක් 2010.03.24 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 21,50,338.63ක මුදලට 2010.03.25 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 7742, 1861 සහ 2299 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, වාද්දුව වස්කඩුව දෙබැද්දේ කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි වස්කඩුව උප කාර්යාලය තුළ මැලෑගම ගමෙහි පිහිටි "වැකඩුල්ලේවත්තේ කට්ටියෙන්" බෙදා වෙන් කළ ලොට් ඒ1හි ලොට් ඒ1බී නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. විජේසූරිය විසින් මැන සාදන ලද අංක 2758 සහ 2005 අගෝස්තු මස 20 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "ඒ1බී2" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2758හි දරන පිඹුරේ ලොට් ඒ1බී1 වලින් ද, නැගෙනහිරට : අංක 2758 දරන පිඹුරේ ලොට් ඒ1බී1 වලින් ද, දකුණට : මහා විහාර පාරේ සිට හබරලගහලන්ද දක්වා ඇති පාරෙන් ද සහ බස්නාහිරට : අඩි 10ක් පළලැති පාරෙන් ද මායිම් වූ අංක 2758 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග පිහිටි ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 176/62 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/9

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කඩවත ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පේදුරු රණේපුර හේවගේ කිත්සිරි ඉන්දලාල්.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රීති නිරංජලා ඒකනායක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2008.09.15 දින අංක 7039 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පේදුරු රණේපුර හේවගේ කිත්සිරි ඉන්දලාල් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිහතර ලක්ෂ නමදහස් අටසිය තිස්නමයයි ශත පනස්එක (රු. 24,09,839.51) ක මුදලක් 2010.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 24,09,839.51ක මුදලට 2010.050.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 7039 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති

බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවලමුල්ල සූරියපාලුව පිහිටි "ගලබොඩවත්ත ගොරකගහවත්ත දෙල්ගහවත්ත ගලබොඩවත්ත බෙලිගහවත්ත බුන්විල හල්ගහකුඹුරේ පිල්ලෑව, කහටගහවත්ත, තුන්හවුල් අඹගහවත්ත සහ ඕතුදෙන හල්ගහ කුඹුර" දරන ඉඩමට බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 1988.06.09 දිනැති සහ අංක 406/1988 දරන පිඹුරෙහි ලොට් අංක 72 දරන කොටසට වන උතුරට : ලොට් 67සී වලින් ද, නැගෙනහිරට : ලොට් 73න් ද, දකුණට : ලොට් ආර් 10න් ද සහ බස්නාහිරට : ලොට් 71න් මායිම් වූ එකී අංක 406/1988 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාසය (අ. 0, රූ. 0, පර්. 16)ක් විශාල ඉඩම ගොඩනැගිලි ගහකොළ, සහ සියළු දේත් සමග වේ.

පිඹුරු අංක 406/1988හි ලොට් ආර්1, ආර්2, සහ ආර්8හි වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-197/8

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බුත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

උඩවත්තගේ දොන් චමින්ද.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2007.06.14 දින අංක 15077 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උඩවත්තගේ දොන් චමින්ද යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හාරලක්ෂ එක්දහස් පන්සිය පනස්හතරයි ශත අනූහත (රු. 4,01,554.97) ක මුදලක් 2009.09.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,01,554.97ක මුදලට 2009.10.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 15077 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළේ, බුත්තල පත්තුවේ, බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩාඔය ගමෙහි පිහිටි "බණ්ඩාරගමවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද 2001.10.14 දින සහ අංක එම් 736හි ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : කුඩා ඔය සඳහා වෙන් කරන ලද කොටසින් ද, නැගෙනහිරට : එල්. වයි. අමාරිස් සිල්වාට අයත් ඉඩම වෙන් කරන ලද මායිමෙන් ද, දකුණට : බුත්තල-වැල්ලවාය ප්‍රධාන පාරෙන් ද සහ බස්නාහිරට : ගඟ දක්වා ඇති පාරෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විසිනවයයි දශම තුන (අ 1, රූ. 1, පර්. 29.3)ක් විශාල ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 45/160 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/7

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බුත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

උඩුවිල ආරච්චිගේ ඉන්ද්‍රානි අසෝකමාලා සහ වල්පිට ගමගේ ගුණවතී.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2003.12.19 දින අංක 11904 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උඩුවිල ආරච්චිගේ ඉන්ද්‍රානි අසෝකමාලා සහ වල්පිට ගමගේ ගුණවතී යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙලක්ෂ එක්දහස් අටසිය අසූඅටයි ශත හැත්තෑදෙක (රු. 2,01,888.72) ක මුදලක් 2010.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ

ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,01,888.72ක මුදලට 2010.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 11904 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල කෝරළේ, පෙට්ටගම්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි පෙට්ටගම්වෙල ගමෙහි පිහිටි රජයේ ඉඩමට මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද පිඹුරු අංක 6සී හි ලොට් 10 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 9 සහ 12න් ද, නැගෙනහිරට : වෙන් කරන ලද පාරෙන් ද, දකුණට : ලොට් 9 සහ වෙන් කරන ලද පාරෙන් ද සහ බස්නාහිරට : ලොට් 12න් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම අටයි බිංදුවයි බිංදුව (හෙක්. 0.800)ක් විශාල ඉඩම තුළ ඇති සියළුම දේත් සමග මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. එම්. 15/128 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/6

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බුත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වීරසිංහ මුදියන්සේලාගේ ගාමිණී වීරසිංහ සහ වික්‍රමසිංහ ආරච්චිලාගේ සුනන්ද මානෙල් වික්‍රමසිංහ.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2004.07.07 දින අංක 12481 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වීරසිංහ මුදියන්සේලාගේ ගාමිණී වීරසිංහ සහ වික්‍රමසිංහ ආරච්චිලාගේ සුනන්ද මානෙල් වික්‍රමසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙලක්ෂ හැටහයදහස් දෙසීය පනස් එකයි ශත තිස්පහ (රු. 2,66,251.35) ක මුදලක් 2010.06.28 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,66,251.35ක මුදලට 2010.06.29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 12481 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බුත්තල කෝරළේ, පුහුල්කොටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි පුහුල්කොටුව ගමෙහි පිහිටි ඉඩමට බලයලත් මානක සී. ජී. පුංචිහේවා විසින් මැන සාදන ලද 2004.04.22 දින සහ අංක 520හි ලොට් 3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ආර රක්ෂිතයෙන් ද, දකුණට : කේ. එච්. සුගතපාල හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 2න් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි දෙකයි තුන (හෙක්. 0.123) ක් විශාල ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 94/246 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බම්බලපිටිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ලසන්තා දිල්හානි පෙරේරා ලියනගේ සහ සෙරින් ඩිලන්කා ශ්‍රී පෙරේරා.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. එස්. හල්පේ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන

ලද්දාවූ ද 2008.08.18 දින අංක 1313 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලසන්තා දිල්හානි පෙරේරා ලියනගේ සහ සෙරින් ඩිලන්කා ශ්‍රී පෙරේරා යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දොලොස් ලක්ෂ හැත්තෑඅටදහස් හාරසිය අසූහතයි ශත දෙක (රු. 12,78,487.02) ක මුදලක් 2010.05.18 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 12,78,487.02ක මුදලට 2010.05.19 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1313 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, ගොරකාපොල සහ වත්තලපොල ගම්වල පිහිටි කෝන්ගහවත්ත, මාරගහවත්ත, උලුගේවත්තපාලඋලඹිවිට කුරුදුවත්ත රතුවත්ත ලොට් සී හි කොටසක් වන ඉඩමට බලයලත් මානක ජේ. කොඩිකාරගේ විසින් පිළියෙල කරන ලද 1998.05.28 දිනැති අංක 2560 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 9 දරන ඉඩම් කොටස වන උතුරට : ලොට් 8 න් ද, නැගෙනහිරට : පී. ජී. අමරදාසගේ ඉඩමෙන් ද, දකුණට : පී. ජී. අමරදාසගේ සහ ආර්. පී. එල්. ලීලාවතී සහ අනෙක් අයගේ ඉඩම් වලින් ද, බස්නාහිරට : ලොට් 3 සහ 10න් ද මායිම් වූ එකී අංක 2560 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 307/240 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත එකී අංක 1313 දරන උකස්කරයේ එකී උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති වෙන් කර ඇති පාරවල් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-197/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අලුත්කඩේ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දුවගේ උපනයන දීප්තිකා පෙරේරා.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2005.01.26 දින අංක 1192 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දුවගේ උපනයන දීප්තිකා පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ අසූදෙදහස් නමසිය අනූවයි ශත පහළොව (රු. 8,82,990.15) ක මුදලක් 2010.05.26 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 8,82,990.15ක මුදලට 2010.05.27 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1192 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ දැනට දළුගම උප කාර්යාලය තුළ දළුගම පිහිටි "මිල්ලගහකුඹුර" නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එස්. රාසප්පා මැන සාදන ලද 1994.03.07 දින සහ අංක 4576 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1ජී දරන ඉඩම් කොටස වන උතුරට : කාණුවෙන් ද, නැගෙනහිරට : ලොට් 1එෆ් සහ 1ජේ වලින් ද, දකුණට : ලොට් 1ජේ සහ 1එච් වලින් ද සහ බස්නාහිරට : ඩබ්. ආර්. ඩයස් හිමිකම් කියන ශාන්ත ජුඩ් මාවතේ, වරිපනම් අංක 58න් සහ අඩි පාරෙන් ද මායිම් වූ එකී අංක 4576 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාලත්වය ඇති ඉඩම වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 533/252 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අංක 1192 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-197/1

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

කොට්ටාව, හොරහේන පාර, නුගේමුල්ල වත්ත, පැතුම් උයන, අංක 11/143හි Y. D. කොන්ක්‍රීට් වර්ක්ස් ඇන්ඩ් බිල්ඩින් මැටීරියල්ස් හි කොටස්කරුවන්

වන ප්‍රභාත් සුමනසේකර සහ ශීලා මාලනී නානායක්කාර මහත්මියගේ ණය වගකීම් සඳහා උකස් කරන ලද දේපල 2009.09.17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2006.06.28 දිනැති අංක 113 දරන බැඳුම්කරයෙන් සුරැකුම් කරන ලද කොට්ටාව, හොරගේන පාර, නුගේමුල්ල වත්ත, පැතුම් උයන, අංක 11/143හි පිහිටි V. D. කොන්ක්‍රීට් වර්ක්ස් සහ බිල්ඩින් මැටීරියල් සප්ලයර්ස් හි ප්‍රභාත් සුමනසේකර මහතා සහ ශීලා මාලනී නානායක්කාර මහත්මිය විසින් ගෙවීම පැහැර හැර ඇති ලංකා බැංකුව ලබාදුන් ස්ථිර අයිරා රුපියල් දසලක්ෂයක් (රු. 10,00,000) මත 2009.07.07 දිනට ස්ථිර අයිරාව මත පිටහිටි ශේෂය සහ පොළිය රුපියල් දහතුන්ලක්ෂ හතලිස් අට දහස් තුන්සිය හතලිස් දෙකයි ශත අසූ එකක (රු. 13,48,342.81) මුදල සමග ස්ථිර අයිරා රුපියල් දසලක්ෂයක (රු. 10,00,000) (ඉක්මවා ගිය මුදල් ප්‍රමාණය වන රුපියල් දෙලක්ෂ විසිහයදහස් පන්සිය හතලිස් හතරයි ශත හතලිස් පහක (රු. 2,26,544.45) ඇතුළත් කොට නැත) මුදලක් මත වර්ෂයකට සියයට විසිපහක (25%) තවදුරටත් පොළිය ද, 2009.07.08 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ප්‍රභාත් සුමනසේකර මහතා සහ ශීලා මාලනී නානායක්කාර මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2009.07.07 දිනට එකී අංක 113 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දහතුන්ලක්ෂ හතලිස් අටදහස් තුන්සිය හතලිස් දෙකයි ශත අසූ එක (රු. 13,48,342.81) මුදල සමග 2009.07.08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරටය අයවිය යුතු පොළිය ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනවල විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව විහාර මාවත, අංක 50/3හි පදිංචි වෙන්දේසිකාර ටී. කරුණාරත්න මහතාට (ටී ඇන්ඩ් එච් ඔක්ෂනියර් හි) එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, මහරගම අධිශ්‍රේණිය ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවේ, රුක්මලේ ග්‍රාමයේ පිහිටි ගොඩපරගහවත්ත නමැති දැන් පැතුම් උයන ලෙස හඳුන්වන, බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 2005 අගෝස්තු මස 15 වැනි දිනැති අංක 4324 දරන මැනුම් පිඹුරේ ලොට් අංක 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : අංක 79/1996 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට : අඩි 15ක් පළල පාර (අංක 47/1996 දරන පිඹුරේ ලොට් R2) ද, දකුණට : අංක 47/1996 දරන පිඹුරේ ලොට් R1 සහ R3 ද, බස්නාහිරට : අංක 4324 දරන පිඹුරේ ලොට් 2 ද මායිම්ව එකී අංක 4324 දරන පිඹුර ප්‍රකාර පර්චස් හතයි දශම අටයි පහක (අ. 0, රූ. 0, පර්. 7.85) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි නවයයි අටක (හෙක්ටයාර් 0.0198) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1650/04 යටතේ ලියාපදිංචි කර ඇත.

රුක්මලේ පිහිටි ගොඩපරගහවත්ත නමැති දැන් පැතුම්උයන ලෙස හඳුන්වන බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඩබ්. ඩී. පෙරේරා විසින් සාදන ලද 1996 මැයි මස 02 දිනැති අංක 47/1996 දරන පිඹුරේ ලොට් R1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් ලොට් R1, උතුරට : ලොට් 11, R2, 7 සහ 6 සහ පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 නොවැම්බර් මස 01 වැනි දිනැති අංක 1088 දරන පිඹුරේ ලොට් D සහ F ද, බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1990 ජනවාරි මස 22 දිනැති අංක 3062 දරන පිඹුරේ ලොට් E4 ද, දකුණට : ලොට් 6, 5 සහ අංක 4303 දරන පිඹුරේ ලොට් 4 සහ ලොට් 23, R5, 21, 20 සහ 19 ද, බස්නාහිරට : ලොට් 23, R5, 21, 20, 19, R4, 16, 15, 12, R3, 11, R2, 7 සහ 6 ද මායිම්ව එකී අංක 47/1006 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිනවයක (අ. 0, රූ. 0. පර්. 29) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතයි තුනයි තුනයි පහක (හෙක්ටයාර් 0.07335) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1650/05 යටතේ ලියාපදිංචි කර ඇත.

සී. ජී. එන්. ප්‍රේමතිලක,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණිය ශාඛාව,
මහරගම.

10-205

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 392137.
උපුල් ශාන්ත විජේසිංහ.

2009 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් තිස්ස දිසානායක විසින් 2006 අගෝස්තු මස 30 වැනි දින සහතික කරන ලද අංක 19608 සහ 2007 සැප්තැම්බර් මස 11 වැනි දින සහතික කරන ලද අංක 19921 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හී නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උපුල් ශාන්ත විජේසිංහ ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් අටලක්ෂ හැටදෙදහස් දෙසීය දහහතරයි ශත විසිතුනක (රු. 8,62,214.23) මුදලක් 2009 සැප්තැම්බර් මස 10 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතු යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ හැටදෙදහස් දෙසීය දහහතරයි ශත විසිතුනක (රු. 8,62,214.23) මුදල අයකර ගැනීම සඳහා 2009 සැප්තැම්බර් මස 11 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,49,875ක මුදල මත 22%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවාද සහ මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 19608 සහ 19921 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර

කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර, කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු ප්‍රෙඩ් විජයවීර විසින් 1997 ජූනි මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 5121හි දැක්වෙන දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වෙල්ලබොඩ පත්තුවේ, කෙමගොඩ ග්‍රාමයේ පිහිටි බොයිතරේකොරටුව කියන ඉඩමේ පස්බිම්, වගාවන්, ගොඩනැගිලි යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන්කර ලොට් A ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : කෙටකැලෑගහවත්ත ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : බන්ඩිගාවරුප්ප ද සහ බස්නාහිරට : කෙටකැලෑගහවත්ත ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස්අටයි දශම දෙකක් (අ. 0, රූ. 1, පර්. 38.2) විශාල ඉඩම. මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B489/32 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-119

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

කොළඹ 15, මට්ටක්කුලිය, ෆ්‍රැන්සිවත්ත පටුමග, අංක 136හි පිහිටි සී/ස බෲක් ටීස් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් සඳහා උකස් කරන ලද වත්තල, හේකිත්ත පටුමග, අංක 33/38හි දේපළ.

2010.06.17 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 2006.11.06 දිනැති අංක 2322 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.05.12 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් එක්කෝටි තුන්ලක්ෂ හාරදහස් තුන්සිය හැත්තෑ අටයි ශත අනූ එකක (රු. 1,03,04,378.91) මුදලක් සමග ණය මත පිටහිටි රුපියල් හැත්තෑ පන්ලක්ෂයක (රු. 75,00,000) මුදලක් මත වසරකට සියයට විසිදෙක (රු. 22%) බැගින් පොලියක් ද, 2010.05.13 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 15, මට්ටක්කුලිය, ප්‍රැන්සිවත්ත පටුමග, අංක 136හි පිහිටි සීමාසහිත බෲක්ටීස් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2322 දරන 2006.11.06 දිනැති බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් එක්කෝටි තුන්ලක්ෂ හාරදහස් තුන්සිය හැත්තෑ අටයි ශත අනූඑකක (රු. 1,03,04,378.91) මුදල සමග 2010.05.13 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) එහි සංශෝධනයල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥානතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) ට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල-මාබෝල නගර සභා සීමාව තුළ වත්තල පිහිටි හේකිත්ත පටුමගේ වරිපනම් අංක 33/38 (කොටස) දරන “බුහුකුඹුර” නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1998.06.02 දිනැති අංක 3456 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පරණ ලන්දේසි ඇල ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් R3 සහ 5 ද, බස්නාහිරට : කැළණි ගඟ ද, මායිම්ව එකී අංක 3456 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස්නවයයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 39.40) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B849/262හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

එකී වත්තල පිහිටි “බුහුකුඹුර හික්ගහවත්ත හෙවත් ලෝලුගහවත්ත, දිවුල්ගහවත්ත සහ කෝන්ගහවත්ත” නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1996.12.09 දිනැති අංක 3375 දරන පිඹුරෙහි ලොට් 4 (මීටර් 6ක් පළල පාර සඳහා වෙන්කළ) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4, උතුරට : එම්. සී. පී. ඩයස්ගේ අංක 33 සහ 33/1 දරන පරිශ්‍ර (හේකිත්ත පටුමග) ද, නැගෙනහිරට : හේකිත්ත පටුමග ද, දකුණට : පාර, එම්. සී. පී. ඩයස්ගේ ඉඩම සහ නැසීගිය හෙන්රි ඇලෝසියස් ඩයස්ගේ උරුමක්කරුවන්ගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 3 ද මායිම්ව එකී අංක 3375 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් අටයි දශම දෙකයි තුනක (අ. 0, රූ. 1, පර්. 8.23) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B257/260හි ලියාපදිංචි කර ඇත.

එකී වත්තල පිහිටි බුහුකුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1966.04.12 දිනැති අංක 1581 දරන පිඹුරෙහි ලොට් 5 (අඩි 12 පළල පාර) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5, උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 4 සහ පාර ද, බස්නාහිරට : ලොට් 2 සහ 1 ද මායිම් වන එකී අංක 1581 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිදෙකක (අ. 0, රූ. 0, පර්. 22) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B257/261හි ලියාපදිංචි කර ඇත.

මේ සමගම මෙයට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. මෙන්ඩිස් විසින් සාදන ලද 1966.01.29 දිනැති අංක 631B හි X සහ X1 ලෙස නිරූපණය කර ඇති එසේම ඉහත විස්තර කර ඇති ඉඩම්වල සිට ප්‍රධාන පාර, ශ්‍රී වික්‍රම මාවත දක්වා පාරෙහි අයිතිය ද ඇත.

එකී වත්තල පිහිටි බුහුකුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1998.06.02 දිනැති අංක 3456 දරන පිඹුරෙහි ලොට් R1 (අඩි 20ක් පළල පාරට වෙන් කළ) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R1 උතුරට : ලොට් 8 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 9 සහ 10 ද, බස්නාහිරට : ලොට් R2 ද මායිම්ව එකී අංක 3456 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිහතයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 27.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B849/233හි ලියාපදිංචි කර ඇත.

එකී වත්තල පිහිටි බුහුකුඹුර නමැති ඉඩමේ අංක 3456 දරන පිඹුරෙහි ලොට් R2 (අඩි 20ක් පළල පාරට වෙන්කළ) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R2 උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 8, R1, 10 සහ 11 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් 7, 6, 4 සහ R3 ද මායිම්ව එකී අංක 3456 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාසයයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 16.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B849/174හි ලියාපදිංචි කර ඇත.

එකී වත්තල පිහිටි බුහුකුඹුර නමැති ඉඩමේ අංක 3456 දරන පිඹුරේ ලොට් R3 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කළ) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R3, උතුරට : ලොට් 1, 2 සහ 3 ද, නැගෙනහිරට : ලොට් R2 ද, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 5 ද, මායිම් ව එකී අංක 3456 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතරයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ, 0, පර්. 14.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B849/175හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,
සම්බන්ධතා කළමනාකරු.

ලංකා බැංකුව,
අයකර ගැනීමේ - ආයතනික,
3 වැනි මහල,
ප්‍රධාන කාර්යාලය,
කොළඹ 01.

10-201

---

## ලංකා බැංකුව - නුවරඑළිය ශාඛාව

### 1968 අංක 34දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010 අගෝස්තු මස 19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ධායුමානවන් මයා විසින් සහතික කරන ලද 1998.09.14 දිනැති අංක 9074, 2002.02.22 දිනැති අංක 10757 හා 2007.11.07 දිනැති අංක 14347 දරන උකස්කර මත මුල් මුදල් හා 2010.06.21 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් දසලක්ෂ නවසිය දහනවයයි ශත පනස්තුනක (රු. 10,00,919.53) මුදල සමග රුපියල් හත්ලක්ෂ දහසය දහස් පන්සිය හතලිස් නවයයි ශත හයක (රු. 7,16,549.06) මුදල මත 2010.06.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දහහතරක (14%) වාර්ෂික පොළියක් ද, නුවරඑළිය, රුවන් එළිය, මාගොඩ, අංක 115 දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ සුසිරිපාල රත්නායක හෙවත් රත්නායක මුදියන්සේලාගේ සුසිරිපාල මයා හා රත්නායක මුදියන්සේලාගේ නාමල් රත්නායක මයා යන අයවළුවන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 1998.09.14 දිනැති අංක 9074, 2002.02.22 දිනැති අංක 10757 හා 2007.11.07 දිනැති අංක 14347 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දසලක්ෂ නවසිය දහ නවයයි ශත පනස් තුනක (රු. 10,00,919.53) මුදලක් සමග 2010.06.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, ඔයපළාත කෝරලේ, බිලැක්පූල් හි පිහිටි සර්වේ ජනරාල් (මිනුම්පති) විසින් සාදන ලදුව ඔහුගේ භාරයේ තබා ඇති පී. පී. එන් යූ. 852 දරන පිඹුරේ කැබලි 33 යනුවෙන් පෙන්නුම් කර ඇති ඉහත කී අංක පී. පී. එන්යූ. 852 දරන පිඹුර හා විවරණය අනුව, උතුරට : එම පිඹුරේ කැබලි 31 සහ 35 ද, නැගෙනහිරට : එම පිඹුරේ කැබලි 34 ද, දකුණට : එම පිඹුරේ කැබලි 51 ද, බස්නාහිරට : එම පිඹුරේ අංක 32 දරන කැබැල්ල ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම බින්දුවයි අටයි නවයක (හෙක්ටයාර් 0.089) වපසරියෙන් යුත් බෙදා වෙන් කරන ලද ස්වර්ණභූමි ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති සියළු දේත් වේ. මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්යූඒ. 11/333/87 වෙළුම/පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. ධර්මරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
නුවරඑළිය.

10-219

---

## ලංකා බැංකුව - දෙවැනි නගර ශාඛාව

### 1968 අංක 34දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010 අගෝස්තු මස 19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2007.11.05 දිනැති අංක 6091, 6092, 6093 සහ 6094 දරන උකස්කර මත මුල් මුදල් (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් හාරලක්ෂ විසිහත්දහස් දෙසිය හැට හයයි ශත දහයක (රු. 4,27,266.10) මුදල බැහැර කොට) හා 2010.05.21 වැනි තෙක් පොලිය වශයෙන් රුපියල් අනූහය ලක්ෂ හතලිස් හයදහස් එකසිය අටයි ශත හතලිස් අටක (රු. 96,46,108.48) මුදල සමග අනුමත කළ සීමාව වන රුපියල් අනූතුන් ලක්ෂ පනස් දහසක (රු. 93,50,000) මුදලක් මත (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් හාරලක්ෂ විසිහත් දහස් දෙසිය හැට හයයි හත දහයක (රු. 4,27,266.10) මුදල බැහැර කොට) 2010.05.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට

දහතුනක (13%) වාර්ෂික පොළියක් ද, වත්තේගම, ප්‍රධාන වීදියේ, අංක 87 දරන ස්ථානයේ පිහිටි "බුහාරි බ්‍රදර්ස් " හි හවුල්කරුවන් වන බුහාරි ඉසදීන් මයා, බුහාරි මීරා මොහිදීන් මයා, බුහාරි අබ්දුල් රහුමාන් මයා, බුහාරි අබ්දුල් කාදර් මයා හා බුහාරි මොහමඩ් ඉස්මයිල් මයා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී අංක 2007.11.05 දිනැති අංක 6091, 6092, 6093 හා 6094 දරන බැඳුම්කර මත අයවිය යුතු රුපියල් අනූනය ලක්ෂ හතලිස් හයදහස් එකසිය අටයි ශත හතලිස් අටක (රු. 96,46,108.48) මුදල (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් හාරලක්ෂ විසිහත්දහස් දෙසිය හැට හයයි ශත දහයක (රු. 4,27,266.10) මුදල බැහැර කොට) සමග 2010.05.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය යටතේ ද, හා එහි සංශෝධනය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ වත්තේගම නගර සභා සීමාව තුළ වත්තේගම පිහිටි මහනුවර බලයලත් මිනින්දෝරු ප්‍රාන්සිස් මාපලගම මයා විසින් සාදන ලද 1955 මාර්තු දිනැති අංක 2987 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් හෙවත් වත්තේගම වත්තේ කොටසක් යයි හඳුන්වනු ලබන ගිණිකොනදෙසට : අංක 91 දරන ස්ථානය ද, නිරිත දෙසට : (නිවැරදිව වයඹ දෙස), අංක 87 දරන ස්ථානය ද, බස්නාහිරට : මහනුවර-පන්විල ප්‍රධාන පාර ද, ඊශාන දෙසට : ෆ්‍රැන්ක්ලන්ඩ් වත්තේ ඉතිරි කොටස ද මායිම් වූ පර්චස් තුනයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 3.75) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ පිහිටා ඇති වරිපනම් අංක 89 දරන ගොඩනැගිල්ල හා අනෙකුත් සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 800/103 දරන පිටුවේ ලියාපදිංචි කර ඇත.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර, පල්ලේගම්පහ කෝරළේ, වත්තේගම නගර සභා සීමාව තුළ වත්තේගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. ඒ. ඩබ්. එන්. ජයතුංග මයා විසින් සාදන ලද 1964 අප්‍රේල් මස 08 වැනි දිනැති අංක 85 දරන පිඹුරේ කැබලි 2 යනුවෙන් පෙන්නුම් කර ඇති "ෆ්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් හෙවත් වත්තේගම වත්තේ කොටසක්" යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 85 දරන පිඹුර අනුව, වයඹ දෙසට : එකී පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති එම ඉඩමේම ඉතිරි කොටස ද, නිරිත දෙසට : මහ පාර ද, ගිණිකොන දෙසට : වරිපනම් අංක 97 සහ 99 දරන ස්ථාන ද, ඊශාන දෙසට : ප්‍රැන්ක්ලන්ඩ් වත්තේ ඉතිරි කොටස ද, මායිම් වූ පර්චස් තුනයි දශම දෙකයි දෙකයි හතක (අ. 0, රූ. 0, පර්. 3.227) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ පිහිටා ඇති ගොඩනැගිල්ල හා සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 668/83 පිටුවේ ලියාපදිංචි කර ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර, පල්ලේගම්පහ කෝරළේ, වත්තේගම නගර සභා සීමාව තුළ, වත්තේගම හි පිහිටි බලයලත් මිනින්දෝරු පී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මයා විසින් සාදන ලද 1984 සැප්තැම්බර් මස 16 දිනැති අංක 1772 දරන පිඹුරේ පෙන්වා ඇති වරිපනම් අංක 79 දරන ඊශානදෙසට : ගරාජ් පාර ද, ගිණිකොනදෙසට : වරිපනම් අංක 81 ද, නිරිත දෙසට : මහනුවර සිට පන්විලට යන මහ පාර ද, වයඹ දෙසට : වරිපනම් අංක 77 ද මායිම් වූ පර්චස් දෙකයි දශම හතරයි එකක (අ. 0, රූ. 0, පර්. 2.41) ප්‍රමාණයෙන් යුත් සියළු ඉඩම හා ස්ථානය ද එහි තුළ පිහිටා ඇති ගොඩනැගිල්ල හා අනෙකුත් සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 800/104 පිටුවේ ලියාපදිංචි කර ඇත.

4. ඉහත කී පරිදි වත්තේගමහි පිහිටි බලයලත් මිනින්දෝරු පී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මයා විසින් සාදන ලද 1989 නොවැම්බර් මස 07 වැනි දිනැති අංක 4742 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති ෆ්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් හි බෙදා වෙන් කරන ලද කොටසක් වන පන්විල පාර, වරිපනම් අංක 78/4ජී දරන ගොඩනැගිල්ල සමග ඊශානදෙසට : වරිපනම් අංක 74, 76 හා 78 ද, ගිනිකොණටදෙසට : නාරන්දන සිට එන පාර ද, නිරිතදෙසට : වරිපනම් අංක 78/4එෆ් ද, වයඹදෙසට : වරිපනම් අංක 78/3 ද මායිම් වූ පර්චස් දෙකයි දශම දෙකයි තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 2.230) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති සෑම සියළු දේත් වේ.

5. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර, පල්ලේගම්පහ කෝරළේ, වත්තේගම නගර සභා සීමාව තුළ වත්තේගම හි පිහිටි, බලයලත් මිනින්දෝරු ආර්. ඒ. ඩබ්. එන්. ජයතුංග මයා විසින් සාදන ලද 1964 අප්‍රේල් මස 08 වැනි දිනැති අංක 85 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "ප්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් හෙවත් වත්තේගම වත්තේ කොටසක්" යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 85 දරන පිඹුර අනුව, වයඹදෙසට : වරිපනම් අංක 91 දරන ස්ථානය ද, නිරිතදෙසට : මහ පාර ද, ගිණිකොනදෙසට : එකී අංක 85 දරන පිඹුරේ කැබලි 2 යනුවෙන් පෙන්නුම් කර ඇති එම ඉඩමේම ඉතිරි කොටස ද, ඊශානදෙසට : ප්‍රැන්ලන්ඩ් එස්ටේට් හි ඉතිරි කොටස ද මායිම් වූ පර්චස් තුනයි දශම දෙකයි දෙකයි හයක (අ. 0, රූ. 0, පර්. 3.226) ප්‍රමාණයෙන් යුත් වත්තේගම, පන්විල පාර වරිපනම් අංක 95 දැනට වරිපනම් අංක 93, ගොඩනැගිල්ලේ කොටසක් වන, එහි පිහිටා තිබෙන සම්පූර්ණ ගොඩනැගිල්ල සමග වූ බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කට්ටිය හා එහි තිබෙන සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 754/195 පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඒ. ඩබ්. ජයසුන්දර,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
මහනුවර.

10-202

---

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - පිළියන්දල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පුබුදිනී ප්‍රසංගිකා ජයවර්ධන,
සිවෝටා ටයර් බැටිරි සෙන්ටර්,
නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන.

2010 ජූලි මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2008.10.29 වැනි දින අංක 3291 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිවෝටා ටයර් බැට්රි සෙන්ටර් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුබුදිනී ප්‍රසංගිකා ජයවර්ධන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් විසිඑක්ලක්ෂ හතලිස්නවදහස් හයසිය අනූහතයි ශත අසූහය (රු. 21,49,697.86) ක මුදලක් 2010.03.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 21,49,697.86ක මුදලට 2010.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3291 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව-පිළියන්දල නගර සභා සීමාව තුළ මාම්පේ පිහිටි මඩපාත පාර, වරිපනම් අංක 157/52/1 දරන "කුරුදුවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 9920 සහ 2005 ජූනි මස 28 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "2ඒ " ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 1549ට අයත් ලොට් 1 න් ද, නැගෙනහිරට : ගුණතිලක හිමිට අයත් දේපලෙන් ද, දකුණට : මෙහි ලොට් 2බී වලින් ද සහ බස්නාහිරට : පාරෙන් ද (පිඹුරු අංක 621හි ලොට් 31) මායිම් වූ එකී අංක 9920 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතර (අ. 0, රූ. 0, පර්. 14) ක විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග පිහිටි ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-197/11

---

### මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 20 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ඩබ්ලිව්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් සහතික කරන ලද අංක 1465 හා 2005.03.29 වැනි දින දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම, ජෝෂප් ප්‍රදීප් කුමාර ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී අංක 1465 දරන උකස්කරය යටතේ දැනට රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස්දෙකයි ශත අනූහතක (රු. 8,33,332.97) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල් සහ එකී රුපියල් අටලක්ෂ තිස්තුන්දහස් තුන්සිය තිස්දෙකයි ශත අනූහතක (රු. 8,33,332.97) මුදල සඳහා 2006.02.04 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහක් (18.25%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද, මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් 2005.03.29 වැනි දින සහතික කළ අංක 1465 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ. මහර ප්‍රාදේශීය සභාවේ දළුගම උප කාර්යාල බල ප්‍රදේශයේ දළුගම ග්‍රාමයේ පිහිටි දැන් ජොනික්වත්ත පාරේ, වරිපනම් අංක 103/32 දරන ගොරකගහවත්ත නමැති ඉඩමෙන් අතුරු බෙදීමක් වන බලයලත් මිනින්දෝරු හා තලම්තිකරු එච්. එම්. ඩොනල්ඩ් මහතා විසින් මැන සාදන ලද අංක 895 සහ 1992.06.22 දින දරන පිඹුරේ කැබලි අංක 1සී වශයෙන් දක්වා ඇති (බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඕ. පී. විජේසිංහ මහතා විසින් මැන සාදන ලද අංක 670 හා 1973.11.12 දින දරන පිඹුරේ කැබලි අංක 1ඒ, 1බී, 1සී වශයෙන් දක්වා ඇති ඒකාබද්ධ ඉඩමේ මායිම් තුළ ප්‍රති මිණුමක් හා උප බෙදීමක් වන) ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම පහයි බිංදුව (අ. 0. රූ. 0, පර්. 22.50)ක් විශාල ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 1ඒ සහ 1බී, නැගෙනහිරට : දැනට ඩබ්ලිව්. ඒ. එල්. විලේගොඩ සහ වෙනත් අයට අයිති කුරුඳුවත්ත නමැති ඉඩම, දකුණට : දැනට ඒ. ඩී. රොසලින් අමරසිංහට අයිති එම ඉඩමේ ලොට් අංක 2 සහ බස්නාහිරට : දැනට ඒ. ඩී. රොසලින් අමරසිංහට අයිති එම ඉඩමේ ලොට් අංක 2 යන සීමාවන් තුළ පිහිටි භූමිය හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දැය ද සමග වේ. මෙම ඉඩම කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු සී 518/198 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී දළුගම ග්‍රාමයේ පිහිටි දැන් ජොනික්වත්ත පාරේ, වරිපනම් අංක 103/32 දරන ගොරකගහවත්ත නමැති ඉඩමෙන් අතුරු බෙදීමක් වන බලයලත් මිනින්දෝරු හා තලම්තිකාර, එච්. එම්. ඩොනල්ඩ් මහතා විසින් මැන සාදන ලද අංක 895 සහ 1992.06.22 දින දරන පිඹුරේ කැබලි අංක 1ඒ (මාර්ග රක්ෂිතය) වශයෙන් දක්වා ඇති (බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඕ. පී. විජේසිංහ මහතා විසින් මැන සාදන ලද අංක 670 සහ 1973.11.12 දින දරන පිඹුරේ කැබලි අංක 1ඒ, 1බී, 1සී වශයෙන් දක්වා ඇති ඒකාබද්ධ ඉඩමේ මායිම් තුළ ප්‍රති මිණුමක් හා උප බෙදීමක් වන) ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.30) ක් විශාල ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. පිලිප්පු පෙරේරාට පෙර අයිතිව තිබූ දැන් එස්. ඒ. ලුවීනෝනා, ඩී. එම්. ඩී. ලුසියා සහ චන්ද්‍රා ගමගේ යන අයට අයිති ඉඩම, නැගෙනහිරට : ලොට් අංක 1බී, දකුණට : ලොට් අංක 1සී, ඒ. ඩී. රොසලින් අමරසිංහ හා මියගිය ඒ. ඒ. මරුක්කු අමරසිංහ ගේ උරුමකරුවන්ට අයිති එම ඉඩමේ ලොට් අංක 02 සහ බස්නාහිරට :

ජොනික්වත්ත පාර යන සීමාවන් තුළ පිහිටි ඉඩම මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ. මෙම ඉඩම කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු සී 518/197, 209හි ලියාපදිංචි වී ඇත.

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ - 01).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය (බටහිර කළාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

10-133

---

## මහජන බැංකුව - කොබෙයිගනේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 20 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.03.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් මුහන්දිරම්ගේ අනුපමා මුහන්දිරම් මිය විසින් සහතික කරන ලද 2003.08.14 දිනැති අංක 2086 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රතුගමගේ ජෝර්ජ් රෝලන්ඩ්, හෙට්ටි ආරච්චිලාගේ කරුණාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ, රුපියල් හාරලක්ෂ දහතුන් දහස් දෙසීය දහතුනයි (රු. 4,13,213) මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.06.30 වැනි දින සිට වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් රුපියල් හාරලක්ෂ දහතුන් දහස් දෙසීය දහතුනක (රු. 4,13,213) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හාරලක්ෂ දහතුන් දහස් දෙසිය දහතුනක (රු. 4,13,213) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 2086 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29ඩී (29D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, බලදොර කෝරළේ, මොරගොල්ල ගමෙහි පිහිටි පලුගහමුල හේන සහ කහටගහමුල හේන නමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජී. ඇස්. ගලගෙදර මහතා විසින් මැන සාදන ලද අංක 5934 දරන හා 1998.10.20 දිනැති පිඹුරේ කැබලි අංක 27 දරන බිම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ කැබලි අංක 13 දරන අඩි 20ක් පළල ප්‍රවේශ මර්ගය, නැගෙනහිරට : එකී පිඹුරේ කැබලි අංක 26 ද, දකුණට : එකී පිඹුරේ කැබලි අංක 32 ද, බටහිරට : එකී පිඹුරේ කැබලි අංක 28 සහ 29 ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1191/14 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 210, කොළඹ පාර,
වැහැර,
කුරුණෑගල.

10-134

---

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - මොණරාගල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

බටවෙල ගමගේ චන්ද්‍රසේන.

2010 ජූලි මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2003.04.10 දින අංක 738 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, බටවෙල ගමගේ චන්ද්‍රසේන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටදෙදහස් අටසිය දාසයයි ශත හැටදෙක (රු. 1,62,816.62) ක මුදලක් 2010.07.06 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,62,816.62ක මුදලට 2010.07.07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 738 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මහ වැදිරට කෝරළේ, සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි සියඹලාන්ඩුව ප්‍රාදේශීය

සහා සීමාව තුළ ශ්‍රී විජිතපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි 6 ගම්මානය හි (සියඹලාන්ඩුව) පිහිටි ඉඩමට සර්වෙයර් ජෙනරාල් විසින් මැන සාදන ලද අංක 66 දරන අවසාන ගම් පිඹුර හි ලොට් 4104 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන, උතුරට : ඇලට වෙන් කරන ලද ලොට් 4092 දරන කොටසින් ද, නැගෙනහිරට : ඇලට වෙන් කරන ලද ලොට් 4102 දරන කොටසින් ද, දකුණට : ලොට් 4102ට අයත් ඇලෙන් ද, ලොට් 4111න් සහ ලොට් 4105 දරන ඇලට වෙන් කරන ලද කොටසින් ද, බටහිරට : ලොට් 4105ට අයත් ඇලෙන් ද සහ ඇලට වෙන් කරන ලද ලොට් 4092 දරන කොටසින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් එකයි දශම බිංදුවයි හයයි අටක (හෙක්. 1.068) ක් හෝ අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් විසිහතයි දශම දෙක (අ. 2, රූ. 2, පර්. 27.2) ක් විශාල ඉඩමට අයත් සියළුම දේත් සමග. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ./ආර්37/95හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අවසාන ගම් පිඹුරු අංක 66 දරන පිඹුරේ දක්වා ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-197/10

---

## ලංකා බැංකුව - වලපනේ ශාඛාව

### 1968 අංක 34දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010 අගෝස්තු මස 19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අන්දරවැව මිය විසින් සහතික කරන ලද 2006.11.16 දිනැති අංක 218 දරන උකස්කරය මත මුල් මුදල් හා 2010.06.21 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් පන්ලක්ෂ හතලිස් පන්දහස් අටසිය අසූ අටයි ශත හැට දෙකක (රු. 5,45,888.62) මුදල සමග රුපියල් හාරලක්ෂ නවදහස් හාරසිය අසූපහයි ශත දෙකක (රු. 4,09,485.02) 2010.06.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දහහතරක (14%) වාර්ෂික පොළියක් ද, කුඹල්ගමුව, තැන්නහේන්වල, පිටියේගෙදර හි පදිංචි චන්ද්‍රිකා වැන්ඩර්වාල් මිය හා රත්නායක මුදියන්සේලාගේ අතුල පද්මරාජා රත්නායක හෙවත් රත්නායක මුදියන්සේලාගේ අතුල පද්මරාජ් රත්නායක මයා යන අයවළුවන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2006.11.16 දිනැති අංක 218 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පන්ලක්ෂ හතලිස් පන්දහස් අටසිය අසූ අටයි ශත හැට දෙකක (රු. 5,45,888.62) මුදලක් සමග 2010.06.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය යටතේ හා එහි සංශෝධනයන් මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්යේ, වලපනේ කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, කුඹල්ගමුව ග්‍රාමයේ, තැන්නහේනවල හි පිහිටි, ලුනුවත්ත, බලයලත් මිනින්දෝරු හා මට්ටම්කරු එච්. එම්. සමරනායක මයා විසින් සාදන ලද 2002 දෙසැම්බර් මස 07 වැනි දිනැති අංක 4216 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "නුගතැන්නේ පිහිල්ලගාව වත්ත" යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 4216 දරන පිඹුර අනුව, උතුරට : එඩ්වින් නමැත්තා විසින් හිමිකම් කියන ලද ඉඩම ද, නැගෙනහිරට : මහ පාර ද, දකුණට : සිරියානන්ද වැන්ඩර්වාල් විසින් හිමිකම් කියන ලද ඉඩම ද, බස්නාහිරට : සිරියානන්ද වැන්ඩර්වාල් නමැත්තා විසින් හිමිකම් කියන ලද ඉඩම ද මායිම් වූ පර්චස් විසි නවයයි දශම දෙකයි හයක (අ. 0, රූ. 0, පර්. 29.26) හෝ හෙක්ටයාර් 0.074ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කට්ටිය හා එහි තුළ පිහිටා ඇති ගොඩනැගිල්ල හා අනෙකුත් සියළු දේත් වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඕ 122/234 වෙළුම/පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. කේ. ජී. ඩිංගිරි බණ්ඩා,
කළමනාකරු.

10-204

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිව් 116 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 391247, 464839 සහ 524810.
කාරියවසම් දේවරක් කෝට්ටගේ දීපාලි රේණුකා පුෂ්පකාන්ති සහ හේවාහකුරු පුණ්‍ය රංජිත් කුමාර.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ජූනි මස 18 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 2984 සහ 2007 සැප්තැම්බර් මස 10 වැනි දින දරන බැඳුම්කරය සහ අංක 3331 සහ 2008 අගෝස්තු මස 14 වැනි දින දරන බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් එහි බන්ධනදායීන් වන ඉහත කී කාරියවසම් දේවරක් කෝට්ටගේ දීපාලි රේණුකා පුෂ්පකාන්ති සහ හේවා හකුරු පුණ්‍ය රංජිත් කුමාර සහ උකස්කරුවන් වශයෙන් හේවා හකුරු පුණ්‍ය රංජිත් කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, ඉහත කී බැඳුම්කර මත 2010

මැයි මස 17 වැනි දිනට රුපියල් තිස්පන්ලක්ෂ දොලොස්දහස් දෙසිය අනූඑකකුත් ශත පනස්හතක (රු. 35,12,291.57) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේ දී ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී රුපියල් තිස්පන්ලක්ෂ දොළොස්දහස් දෙසිය අනූඑකකුත් ශත පනස්හතක (රු. 35,12,291.57) මුදල සහ 2010 මැයි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් තිස්ලක්ෂ අටදහස් දෙසීයක (රු. 30,08,200) මුදල මත වර්ෂයකට 20% බැගින් පොළිය ද, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් වෙනත් මුදලක් (වේනොත්) එම මුදල අඩුකර අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2984 සහ 3331 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, අළුත් කඩේ වීදියේ අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙලබඩපත්තුවේ, කරන්දෙනිය කුරුදුගහ හැතැප්ම පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් B නමැති බිම් කොටසට මායිම්, උතුරට : ඇළ සහ ඇළ දිගේ වෙන් කළ ඉඩම් කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් C ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 1 (අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් A ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටයාර් 0.0253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A95/77 සහ A11/29 හරස් යොමුව සහිතව A255/191 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපළ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙලබඩපත්තුවේ, කරන්දෙනිය කුරුදුගහ හැතැප්ම පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමේ ලොට් 5 නමැති බිම් කොටසට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් B නමැති බිම් කොටසට මායිම්, උතුරට : ඇළ සහ ඇළ දිගේ වෙන් කළ ඉඩම් කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් C ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 1 (අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් A ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටයාර් 0.0253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

(2) ඉහත කී කරන්දෙණිය කුරුදුගහ හැතැප්ම පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් C නමැති බිම් කොටසට මායිම්, උතුරට : ඇළ සහ ඇළ දිගේ වෙන් කළ ඉඩම් කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් D ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 1 (අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් B ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටෙයාර් 0.0253 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A95/77 සහ A11/29 හරස් යොමුව සහිතව A255/192 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපළ පහත සඳහන් පරිදි ද විස්තර කෙරේ.

ඉහත කී කරන්දෙණිය කුරුදුගහ හැතැප්ම අස්සලුකන්දඅද්දර ඕවිට (T. T. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් C නමැති බිම් කොටසට මායිම්, උතුරට : ඇල සහ ඇළ දිගේ වෙන් කළ ඉඩම් කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් D ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 1 (අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් B ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටයාර් 0.0253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

(3) ඉහත කී කරන්දෙණිය කුරුදුගහ හැතැප්ම පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් E නමැති බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් I (අඩි 12 පළල ප්‍රවේශ මාර්ගය) ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් D ද, දකුණට : අස්සලුකන්ද අද්දර ඕවිටේ ලොට් 6 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් F ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටෙයාර් 0.253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A95/77 සහ A11/29 හරස් යොමුව සහිත A255/193 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපළ පහත සඳහන් පරිදි විස්තර කෙරේ-

ඉහත කී කරන්දෙණිය කුරුදුගහ හැතැප්ම අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් E නමැති බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් I (අඩි 12 පළල ප්‍රවේශ මාර්ගය) ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් D ද, දකුණට : අස්සලුකන්ද අද්දර ඕවිටේ ලොට් 6 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් F ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටෙයාර් 0.253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

(4) ඉහත කී කරන්දෙණිය කුරුදුගහ හැතැප්ම පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් F නමැති බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 1 (අඩි 12 පළල පාර) ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් E ද, දකුණට : අස්සලුකන්ද අද්දර ඕවිටේ ලොට් 4 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් G ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටෙයාර් 0.253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ

කාර්යාලයේ A95/77 සහ A11/29 හරස් යොමුව සහිත A255/194 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපළ පහත සඳහන් පරිදි විස්තර කෙරේ-

ඉහත කී කරන්දෙණිය කුරුඳුගහ හැතැප්ම පිහිටි අස්සලුකන්දඅද්දර ඕවිට (T. P. 223373 දරන පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිරි විසින් මැන සාදන ලද අංක 893 සහ 2003 මාර්තු මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් F නමැති බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 1 (අඩි 12 පළල පාර) ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් E ද, දකුණට : අස්සලුකන්ද අද්දර ඕවිටේ ලොට් 4 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් G ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 893 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) නොහොත් හෙක්ටෙයාර් 0.253ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

තව ද ඉහත කී අංක 893 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 1 මතින් ගමන් කිරීමට පෙරළා පැමිණීමට, පසුකර යාමටත්, සියලු සම්පූර්ණ බාධා රහිත සහ නිරවුල් නිදහස සහ බලය ද එකී ඉඩම් කැබැල්ල දිගේ ද ඉහළින් සහ පහළින් ද, භූගතව ද, විදුලි, ජල සේවා සහ වෙනත් ප්‍රධාන නළ මාර්ග ඉදිකිරීම් එළීම, සහ සවිකිරීම සඳහා අයිති ද සමග ය.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

10-121

---

## සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එන්. කේ. හීන්කෙන්ද විසින් ලියා සහතික කරන ලද අංක 717 හා 2007 අගෝස්තු මස 24 වැනි දින දරන මුල් උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දඹුල්ලේ සමරසිංහ ලියනආරච්චිගේ ලයනල් චන්ද්‍රසිරි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 717 දරන උකස් බැඳුම්කරය මත, එකී සමරසිංහ ලියනආරච්චිගේ ලයනල් චන්ද්‍රසිරි යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් හාරලක්ෂ තිස්නව දහස් නවසිය අසූවකුත් ශත දහනවයක (රු. 4,39,980.19) මුදලක් සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ හැටහත් දහස් තුන්සිය දහඅටකුත් ශත අසූ එකක් (රු. 3,67,318.81) සඳහා වර්ෂයකට සියයට විස්සකුත් දශම අටයි හතක් (20.87%) බැගින් පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හාරලක්ෂ තිස්නව දහස් නවසිය අසූවකුත් ශත දහනවයක (රු. 4,39,980.19) මුදල සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ හැටහත් දහස් තුන්සිය දහඅටකුත් ශත අසූ එකක් (රු. 3,67,318.81) සඳහා වර්ෂයකට සියයට විස්සකුත් දශම අටයි හතක් (20.87%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නෙගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන), පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 717 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා එහි පිහිටි සියලු දේ බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 717 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹුල්ල වගපනහ, පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශ සීමාව ඇතුළත පිහිටි වැඩහිටපුයාය, වට්ටක්කායාය, කපුපොත ගල්කුරුගහයාය, දංගවිල්ලේයාය, කැතිනිටිගලේයාය, සහ ගල්කරුගාව කටුපොත නමැති ඒකාබද්ධ ඉඩම්වලින් බයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. දසනායක විසින් මැන සකස් කළ අංක 3319 හා 1998 අප්‍රේල් මස 27 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් සී ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී අංක 3319 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 3945 දරන පිඹුරේ ලොට් අංක 74හි කොටසක් ද, නැගෙනහිරට : අංක 3945 දරන පිඹුරේ ලොට් අංක 132 ලකුණු කළ පාර සඳහා වෙන් කළ බිම ද, දකුණට : දඹුල්ලේ සිට ගෙවල්වලට යන අංක 3945 දරන පිඹුරේ ලොට් අංක 137 ලෙස ලකුණු කළ පාර ද, බස්නාහිරට : අංක 3945 දරන පිඹුරේ ලොට් අංක 75හි කොටසක් ද, යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් දෙකයි දශම පහක් (අ. 0. රූ. 1, පර්. 2.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි ද අංක 3319 දරන පිඹුරේ ලොට් අංක 132 සහ 137 මතින් මාර්ග අයිතිය සහ ප්‍රවේශ වීමේ අයිතිය සහ එම ඉඩමේ පිහිටි වෙනත් සියළු දේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව් ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-112

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - යක්කලමුල්ල ශාඛාව
## (කලින් රුහුණ සංවර්ධන බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරණ *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණු සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2009.12.11 දින පවත්වන ලද රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණු සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සමන් රේණුකා නාරංගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2007.04.08 දිනැති අංක 2350 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වැලිහේන, හිරියමල්කුඹුර, යක්කලමුල්ල ලිපිනයේ පදිංචි කයිකාර හේවගේ අමරදාස සහ නිල්වලහේන, හිරියමල්කුඹුර, යක්කලමුල්ල ලිපිනයේ පදිංචි කයිකාරහේවගේ සුනිල් යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් හැත්තෑපන්දහස් හයසිය හැත්තෑපහක (රු.75,675) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008 ජූලි මස 09 වැනි දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් හැත්තෑපන්දහස් හයසිය හැත්තෑපහක (රු.75,675) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2350 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තල්පේ (උතුර) හිරියමල්කුඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ අ.ග.පි. 642 හිරියමල්කුඹුර ගමේ පිහිටි, උතුරට : එල්.එල්.22328, ආර්. ජී. පුල්ලිනාගේ ඉඩම ද, නැගෙනහිරට : එල්.එල්. 54638 දරන මානගේ කරුණාවතීගේ ඉඩම ද, දකුණට : එල්.එල්. 54640 එම්. ඩී. සිරිසේනගේ ඉඩම ද, බස්නාහිරට : ප්‍රවේනි ඉඩම ද, මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ.0, රූ.01, පර්.00)ක් විශාල ඉඩමේ බිම හා එයට අයත් සියලු ගහකොළ පලතුරු ද වේ.

එකී ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ ඩී 63/181 හි වංචල 56/03 හි 2008 ජුනි මස 09 වැනි දින ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 15 වැනි දින.
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
පඹුරණ, මාතර.

10-86/1

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - කැකණදුර ශාඛාව
## (කලින් රුහුණ සංවර්ධන බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරණ *අති විශේෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2009.12.11 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2005.11.25 දිනැති අංක 4347 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නායිමන, මාකාවිට, වෙලේගෙදර ලිපිනයේ පදිංචි කලුගමගේ සුදර්ශන කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්නමදහස් තුන්සිය අසූ හයයි ශත අසූ අටක (රු. 2,59,386.88) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2008 ජනවාරි මස 31 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් දෙලක්ෂ පනස්නමදහස් තුන්සිය අසූහයයි ශත අසූ අටක (රු. 2,59,386.88) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 4347 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුවේ කැකණදුර පිහිටි ආරෙවත්තේ පිට කොරටුව *හෙවත්* කහටගහවත්ත නැමැති ඉඩමට බ.මි. කේ. ජී. එස්. යාපා මහතාගේ අංක 3355/2003.05.03 දින දරන සැළැස්ම ප්‍රකාර බෙදා වෙන් කළ අංක 01 දරණ කැබැල්ල උතුරට : රාජසන්තක ඉඩම ද, නැගෙනහිරට : මෙම සැළැස්මේ අංක 02 දරන කැබැල්ලද, දකුණට : ආරෙවත්ත සහ මෙම සැළැස්මේ අංක 03 දරන කැබැල්ල ද, බස්නාහිරට : රාජසන්තක ඉඩම ද, යන මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියලුම දේ සම්පූර්ණයෙන් ද,

තවද එම ඉඩමට ප්‍රධාන පාරේ සිට යෑම ඊමට ඇති ඉහත කී අංක 3355/2003.05.03 දින දරන සැළැස්මේ අංක 03 දරන බිම් තීරය මාර්ග පරවශ්‍යතාවයක් ලෙස පාවිච්චි කිරීම සහ ප්‍රයෝජනයට ගැනීමේ අයිතියද වේ.

එකී ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 585/57 හි වංචල 36/95 හි 2005 දෙසැම්බර් මස 07 වැනි දින ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 15 වැනි දින.
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
පඹුරණ, මාතර.

10-86/2

### ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - අක්මීමණ ශාඛාව
(කලින් රුහුණ සංවර්ධන බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2009.12.11 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන මහතා විසින් සහතික කරන ලද 2006.09.05 දිනැති අංක 4730 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගාල්ල, ගොඩකන්ද, කරාපිටිය වත්ත ලිපිනයේ පදිංචි දෙද්දුගොඩගමගේ උපාසක සහ වලහන්දුව, මානවිල, කිරින්දෙගොඩ ලිපිනයේ පදිංචි මලල්ගොඩපිටිය ගමගේ මෛත්‍රීපාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස්දහසක (රු.,140,000) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2009 ජූලි මස 31 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් එක්ලක්ෂ හතලිස්දහසක (රු.1,40,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 4730 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාලු කඩවත්සතර තුළ ගොඩකන්ද පිහිටි, කරාපිටියවත්ත අංක 01 දරන කැබැල්ල නැවත බෙදා වෙන් කළ "සී" අක්ෂරය දරන කැබැල්ල නම්වූ උතුරට : මෙම ඉඩමේ "බී" අක්ෂරය දරණ කැබැල්ල ද, නැගෙනහිරට : කරාපිටිය සිට ගොඩකන්දට යන ප්‍රධාන පාර ද, දකුණට : මෙම ඉඩමේ "ඩී" අක්ෂරය දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලුම දෙය ද වේ.

එකී ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 531/82 හි වංවල 119/177 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 15 වැනි දින.
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
පඹුරණ, මාතර.

10-86/3

---

### මහජන බැංකුව - කොබෙයිගනේ ශාඛාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.03.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. කේ. අත්තනායක මහත්මිය විසින් සහතික කරන ලද 2007.05.16 දිනැති අංක 263 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වර්ණකුලසූරිය ඉලංගසිංහ ජයතිලක මුදියන්සේලාගේ ආතර් සිංඤෝ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ, රුපියල් හාරලක්ෂ හැත්තෑ අටදහස් දෙසිය දහහතරයි ශත පනස් හතයි (රු. 4,78,214.57) මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.02.06 වැනි දින සිට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් රුපියල් හාරලක්ෂ හැත්තෑ අටදහස් දෙසිය දහහතරයි ශත පනස් හතයි (රු. 4,78,214.57) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හාරලක්ෂ හැත්තෑ අටදහස් දෙසිය දහහතරයි ශත පනස් හතයි (රු. 4,78,214.57) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 263 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29ඞී වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, බලදොර කෝරළේ, කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හිරිවැව ගමෙහි පිහිටි දන්ගහමුලගේන නම් ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු වයි. එම්. ඒ. යාපා මහතා විසින් 1993.02.10 දින මැන සාදන ලද අංක 3510 දරන පිඹුරේ කැබලි අංක 06 දරන බිම් කොටස සහ එහි පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ.

ඉඩමට මායිම්, ලොට් 06 උතුරට : අංක 3510 දරන පිඹුරේ ලොට් අංක 05, නැගෙනහිරට : විතිකුලිය සිට නුගවැව හන්දිය දක්වා දිවෙන ප්‍රධාන පාර, දකුණට : අමුණුකොලේ සිට විතිකුලිය-නුගවෙල පාර, බස්නාහිරට : ඉසනේරිස් ප්‍රනාන්දුට අයත් ඉඩම (අ. 0, රූ. 1, පර්. 37) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1056/242 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 210, කොළඹ පාර,
වැහැර,
කුරුණෑගල.

10-132

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ලියාපදිංචි අංක පී. කිව් 116) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නිශ්චය කරගනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 456678.
මොරගොඩගේ පෝල් සාලිය පින්තු.

2010 අප්‍රේල් මස 26 වැනි දින රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. අයි. ජයසූරිය විසින් 2008 ජූලි මස 07 වැනි දින සහතික කරන ලද අංක 383 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, මොරගොඩගේ පෝල් සාලිය පින්තු ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන එකක් සහ අට ලක්ෂ තුන් දහස් පනස් දෙකක් සහ ශත දහසයක (රු.18,03,052.16) මුදලක් 2009 ඔක්තෝබර් මස 16 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අය විය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකක් සහ අට ලක්ෂ තුන් දහස් පනස් දෙකක් සහ ශත දහසයක (රු.18,03,052.16) මුදල අයකර ගැනීම සඳහා 2009 ඔක්තෝබර් මස 17 දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 15,00,000 ක මුදල මත 21% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 383 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්.බී.සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### ඉහත යොමු කරන ලද උපලේඛනය

අනුඥාලත් මිනින්දෝරු කේ. ඒ. කපිල එදිරිසිංහ විසින් 2006 ඔක්තෝබර් 04 වැනි දින සාදන ලද පිඹුරු අංක 1360 හි දැක්වෙන බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුල මාළඹේ පිහිටි දෙල්ගහවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් සී 1 (අනුඥාලත් මිනින්දෝරු ටී. එම්. විජයරත්න විසින් 1992 දෙසැම්බර් මස 20 වන දින සාදන ලද පිඹුරු පත් අංක 191 හි ලොට් C කොටස නැවත බෙදා වෙන් කරන ලදී) ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 255/ඒ තුල පිහිටි ලොට් 35 කොටස, නැගෙනහිරට : පිඹුරු අංක 255/ඒ තුල පිහිටි ලොට් සී 2 කොටස, දකුණට : අඩි 30 පළල පාර (පිඹුරු අංක 255/ඒ හි ලොට් ආර් 4), බස්නාහිරට: පිඹුරු අංක 191 පිහිටි ලොට් බී යන ඉඩම් කැබලි ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 1360ට අනුව පර්චස් දොළහක් (අ. 0, රූ. 0, ප. 12) විශාල ඉඩම. හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්‍යාලයේ ජී 1770/103 වෙළුම / පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-116

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - කරන්දෙනිය ශාඛාව
(කලින් රුහුණ සංවර්ධන බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරණ අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2008.10.06 වැනි දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. සුමිත් නන්දන ද සිල්වා මහතා විසින් සහතික කරන ලද 2005.04.26 දිනැති අංක 953 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බලපිටිය, ගාලුපාර, අංක 1/55, දරණ ලිපිනයේ පදිංචි මුකුන්දාදුර බන්දුල පෙරේරා කරුණාරත්න මහතා සහ ඇනිගේ නාමලී වාසනා යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් එක් ලක්ෂ හතලිස් අටදහස් පන්සීයයක (රු. 1,48,500) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008 අගෝස්තු මස 18 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් එක්ලක්ෂ හතලිස් අටදහස් පන්සීයයක (රු. 1,48,500) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 953 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළේ වැලිතරට අයත් බ්‍රාහ්මණවතුගොඩ, (බ්‍රාහ්මණවත්ත) පිහිටි බලයලත් මානක ඒ. සමරරත්න මහතාගේ අංක 222ඒ සහ 1989 නොවැම්බර් මස 06 වැනි දින දරණ පිඹුරේ නිරූපිත "වලික්කනවත්තේ ලොට් 03" නැමති උතුරට : මෙම ඉඩමේ ලොට් 04 ද, නැගෙනහිරට : ගාල්ල කොළඹ මහා මාර්ගය ද, දකුණට : බෝගහවත්ත ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 02 ද මායිම් වන පර්චස් නවය (අ. 0, රූ. 0, පර්. 09)ක් විශාල ඉඩම සහ ඊට අයත් සියළු දේත් ද වේ.

02. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළේ වැලිතරට අයත් බ්‍රාහ්මණවතුගොඩ, (බ්‍රාහ්මණවත්ත) පිහිටි බලයලත් මානක ඒ. සමරරත්න මහතාගේ අංක 222ඒ සහ 1989 නොවැම්බර් මස 06 වැනි දින දරණ පිඹුරේ නිරූපිත "වලික්කන්වත්තේ ලොට් 02" නැමති උතුරට : මෙම ඉඩමේ ලොට් 01 සහ රජයට අයිති මෙම ඉඩමේ කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 04 සහ 03 ද, දකුණට : බෝගහවත්ත ද, බස්නාහිරට : රජයට අයිති මෙම කොටස ද, මායිම් වන පර්චස් තිස් එක (අ. 0, රූ. 0, පර්. 31) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි නිවාස ආදී සියලුම දෙය ද වේ.

මෙම දේපල බී 295/277,278 හි වංචල 10/174 යටතේ 2005 මැයි මස 25 වැනි දින බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 ඔක්තෝම්බර් මස 06 වැනි දින.
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
දකුණු ප්‍රාදේශීය කාර්යාලය,
පඹුරණ, මාතර.

10-86/4

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ඔක්තෝබර් | 2010.10.01 | සිකුරාදා | 2010.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.08 | සිකුරාදා | 2010.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.15 | සිකුරාදා | 2010.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.21 | බ්‍රහස්පතින්දා | 2010.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.29 | සිකුරාදා | 2010.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2010.11.04 | බ්‍රහස්පතින්දා | 2010.10.21 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.12 | සිකුරාදා | 2010.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.11.19 | සිකුරාදා | 2010.11.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.26 | සිකුරාදා | 2010.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2010.12.03 | සිකුරාදා | 2010.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.10 | සිකුරාදා | 2010.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.17 | සිකුරාදා | 2010.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.24 | සිකුරාදා | 2010.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.31 | සිකුරාදා | 2010.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.